# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1877/80 - 2014 අගෝස්තු මස 29 වැනි සිකුරාදා - 2014.08.29**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**ගාල්ල උණවටුන ඓතිහාසික වැල්ලේ දේවාල පූජනීය ප්‍රදේශය පූජාභූමියක් ලෙස ප්‍රකාශයට පත් කිරීම**

අංක 1681/3 හා 2010 නොවැම්බර් මස 22 වැනි සඳුදා අති විශෙෂ ගැසට් පත්‍රයේ
පළ කරන ලද නියමය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1681/3 - 2010 නොවැම්බර් මස 22 වැනි සඳුදා ප්‍රසිද්ධ කරන ලද අති විශෙෂ ගැසට් පත්‍රය මඟින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා විසින් කරන ලද නිවේදනය පරිදි බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍ය ආචාර්ය දිසානායක මුදියන්සේලාගේ ජයරත්න වන මා හට පැවරී ඇති පූජාභූමි සැලසුම්කරණය හා සංවර්ධනය විෂයය ප්‍රකාරව මෙහි උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන ඉඩම් ප්‍රදේශයේ චිරාත් කාලීන සුරක්ෂිත බව සඳහා එම ප්‍රදේශය පූජනීය ප්‍රදේශයක් බවටත් එය “ගාල්ල උණවටුන ඓතිහාසික වැල්ලේ දේවාල පූජාභූමිය” යනුවෙන් හඳුන්වනු ලැබිය හැකි බවටත් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ආචාර්ය දි.මු. ජයරත්න,
බුද්ධශාසන හා ආගමික කටයුතු අමාත්‍ය.

2014 අගෝස්තු මස 20 වැනි දින,
බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යාංශය,
අංක 135, අනගාරික ධර්මපාල මාවත,
කොළඹ 07.

*උපලේඛනය*

***ගාල්ල උණවටුන ඓතිහාසික වැල්ලේ දේවාල පූජා භූමිය සංයුක්ත වන ප්‍රදේශය***

මිනින්දෝරු ජනරාල්ගේ 2011 දෙසැම්බර් මස 24 වැනි දිනැති අංක GA/HBR/2011/385 දරන අනුරේඛනයේ නිරූපිත දකුණු පළාතේ, ගාල්ල පරිපාලන දිස්ත්‍රික්කයේ හබරාදූව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උණවටුන බටහිර ග්‍රාමයේ පහත දැක්වෙන පරිදි මායිම් වූ හෙක්ටයාර් 0.7070 ක් වූ A,B,C,D,E, සහ F යන අක්ෂර දරන කැබලිවල දක්වා ඇති මුළු භූමි ප්‍රදේශය:-

**A අක්ෂරය දරන කැබැල්ලට මායිම්**

| | |
|---|---|
| උතුරට | : වී. අමරසිංහ සහ තවත් අය හිමිකම් කියන නරියන්පිට්ටනිය, එම්.ජී. ජයසේකර සහ තවත් අය හිමිකම් කියන දේවාලේතුඩුවෙගොඩ සහ මෙම අනුරේඛනයේ C සහ E අක්ෂර දරන කැබලි ; |
| නැගෙනහිරට | : එම්.ජී. ජයසේකර සහ තවත් අය හිමිකම් කියන දේවාලේතුඩුවෙගොඩ සහ මෙම අනුරේඛනයේ C සහ E අක්ෂර දරන කැබලි ; |
| දකුණට | : මෙම අනුරේඛනයේ F අක්ෂරය දරන කැබැල්ල, මුහුදු වෙරළ සහ වෙරළ රක්ෂිතය සහ මෙම අනුරේඛනයේ B අක්ෂරය දරන කැබැල්ල ; |
| බස්නාහිරට | : මෙම අනුරේඛනයේ B අක්ෂරය දරන කැබැල්ල, මුහුදු වෙරළ සහ වෙරළ රක්ෂිතය. |

**B** අක්ෂරය දරන කැබැල්ලට මායිම්

E අක්ෂරය දරන කැබැල්ලට බටහිර දිශාවට වන්නට පිහිටි වෙරළ රක්ෂිතය

**C** අක්ෂරය දරන කැබැල්ලට මායිම්

උතුරට : එම්.ජී. ජයසේකර සහ තවත් අය හිමිකම් කියන දේවාලේතුඩුවෙගොඩ සහ මෙම අනුරේඛනයේ D අක්ෂරය දරන කැබැල්ල ;

නැගෙනහිරට : එම්.ජී. ජයසේකර සහ තවත් අය හිමිකම් කියන දේවාලේතුඩුවෙගොඩ සහ මෙම අනුරේඛනයේ D සහ E අක්ෂරය දරන කැබැල්ල ;

දකුණට : මෙම අනුරේඛනයේ E සහ A අක්ෂර දරන කැබලි ;

බස්නාහිරට : මෙම අනුරේඛනයේ A අක්ෂරය දරන කැබැල්ල සහ එම්.ජී. ජයසේකර සහ තවත් අය හිමිකම් කියන දේවාලේතුඩුවෙගොඩ.

**D** අක්ෂරය දරන කැබැල්ලට මායිම්

මෙම අනුරේඛනයේ E අක්ෂරය දරන කැබැල්ලට දකුණු දිශාවට වන්නට පිහිටි වෙරළ රක්ෂිතය.

**E** අක්ෂරය දරන කැබැල්ලට මායිම්

උතුරට : මෙම අනුරේඛනයේ C සහ D අක්ෂර දරන කැබලි;

නැගෙනහිරට : මෙම අනුරේඛනයේ D සහ F අක්ෂර දරන කැබලි;

දකුණට : මෙම අනුරේඛනයේ F සහ A අක්ෂර දරන කැබලි;

බස්නාහිරට : මෙම අනුරේඛනයේ A සහ C අක්ෂර දරන කැබලි.

**F** අක්ෂරය දරන කැබැල්ලට මායිම්

මෙම අනුරේඛනයේ C අක්ෂරය දරන කැබැල්ලට නැගෙනහිර දිශාවට වන්නට පිහිටි වෙරළ රක්ෂිතය.

09 - 503

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.